# අවුරුද්ද එයි - අවුරුද්ද යයි

**. . . . වෙනත් විදිහකට කියන්නේ නම් ඉතා වේගයෙන් අපි වයස්ගත වෙමින් සිටිමු. පැහැදිලිව කියන්නේ නම් අපි ඉතා ඉක්මණින් මරණය වෙත ළං වෙමින් සිටින්නෙමු. මේ සා වේගයෙන් ගෙවී යන කාලය තුළ අපි කුමක් කරන්නෙමුද? අපි, අපට හෝ අප සමාජයට කුමක් කරන්නෙමුද?**

2009 වසර ද උදා වී මසක් ගෙවී ගොස්ය. කාලය ගෙවී යාම හීයක වේගයටත් වඩා අඩු, පරිගණක යතුරක් ඔබා ලෝකය පුරා සැණෙකින් ඉගිලී යන අන්තර්ජාල පණිවුඩ හුවමාරු ක්‍රමයටත් වඩා ඉක්මන් දැයි විටක සිතේ. එතරම්ම නොදැනී, කාලය ගෙවී යයි. වෙනත් විදිහකට කියන්නේ නම් ඉතා වේගයෙන් අපි වයස්ගත වෙමින් සිටිමු. පැහැදිලිව කියන්නේ නම් අපි ඉතා ඉක්මණින් මරණය වෙත ළං වෙමින් සිටින්නෙමු. මේ සා වේගයෙන් ගෙවී යන කාලය තුළ අපි කුමක් කරන්නෙමුද? අපි, අපට හෝ අප සමාජයට කුමක් කරන්නෙමුද?

කුමක් වුව ද නොමැරෙන සේ අපි ජීවත් වෙමු. එකිනෙකාට මග හරස් කර, ඔවුන්ට වැටෙන්නට ඉඩ දී සිනාසෙමු. සමාජයට යහපතක් කරනු අටියෙන් අයහපතම කරමින් සිටිමු. අනෙකා ගැන සිතීමෙන් ඵලක් නැත. ඔවුනට යහපත සැලසීමෙන් ද ඵලක් නැත. අප සුවසේ සිටිය යුතු ය.

දේශපාලකයෝ දේශය පාලනය කරනු වෙනුවට නන් විධ ක්‍රීඩාවන් හි නිරත ව සිටිති. ඒවා ඉතා සුන්දර ය. රජ මැතිඳුන් සහ ඒ අවට සිටින්නෝ භාග්‍යවන්තයෝම ය. ඔවුන්ගේ අඩුපාඩු සපුරන්නට මිලියන ගණනක මහ ජනතාව සැදී පැහැදී සිටී.

බොහෝමයක් ගුරුවරු වැරදි පාඩම් කියා දෙමින් දරුවන්ට උගන්වමින් සිටිති. තරගයත්, හෙම්බත් වීමත්, කට පාඩම් කරගත් දැනුමත් හැරෙන්නට, අප දරුවන් උගන්නේ කුමක්දැයි සිතන්නටවත් වුවමනාවක් අපට නැති ගානය. ඒ අපේ දරුවන්..., අනාගතය සදනු ඇත. අපි හීන දකිමින් සුවසේ නිදමු. පාට පාට හීන හරිම අපූරුය. ඒ හීන උන්ටම පොවමින්, හීන ලෝක මවා දීම කෙතරම් ආශ්චර්යයක් ද? දරුවන්ට හරි මග කියා දීමෙන් ඇති ඵලයක් නැත. උන් සංවේදී මිනිසුන් කිරීමෙන් ඇති කාරිය කිම? එනිසා, කමකට නැති විකාර රූපපෙට්ටි අසළ ම උන් ගැවසුණාදෙන්. ඒ බහුභූත මනෝ විකාරම දරුවන්ගේ පූර්වාදර්ශ බවට පත් කර දෙමු. අනාගතයේ දවසක උන්ටම දොස් නගන්නට ද අප පසුබට වන්නේ කුමටද? ඒ උන්ගේ වරදය. මව්පියන් ලෙස අපට කළ හැකි දෙයක් නැත. උන්, උන්ගේ ලෝකය ඇදට තනා ගත්ත ද, සෘජුව තනා ගත්තද, නැතහොත් වක්‍රාකාරව ගොඩ නගා ගත්තද, ඒ උන්ටම ය. කියා දිය යුතු දෙයක් ද නැත. අපි හැල්මේ දුවමු. ඒ සැහේ ය. ඇස් වල, හඬන්නට කඳුළු නැති නිසා, සිත් වල සිරවුණු සුසුම් නැති නිසා හරි පහසු ය.

අනෙකා ගැන අඩුවෙන්ම සිතන්නට ඕනෑ ය. අනෙකා සිත රිදවන්නටම ඕනෑ ය. මෙත්, කරුණා, මුදිතා පොත්වලම පමණක් සිර වී තිබුණාවේ. ඕනෑ තරම් බණ අසාගෙන හිඳීමත් මොන තරම් සැපයක් ද? අනෙකා රවටමින් ජීවත් වීමත් මොනතරම් සතුටක් ද? අප ද රැවටී ජීවත් වීම ඊටත් වඩා සතුටකි.

ගැහැණු සහ පිරිමි එක්ව ලෝකය ගොඩ නගති. ඒ.. වනසන්නේ අනෙකුන් ය. ඒ.. ගැහැණුන් හෝ පිරිමින් නොවේ. ඒ මිනිසුන් ද නොවනු ඇත.

ලෝකය යනු අරුම පුදුමයකි. අවුරුද්දට කළ හැකි කිසිවක් ම නැත. අප කිසිවක් කළ යුතු ද නැත.

අවුරුද්ද එයි.. අවුරුද්ද යයි..

තුෂාරි ප්‍රියංගිකා




# ටින් ටින් ට අසූවයි


ජෝර්ජ් රේමි

බෙල්ජියම් ජාතික ජෝර්ජස් රේමි (Georges Remi) විසින් නිර්මාණය කරන ලද ටින් ටින් සිය කාටූන් සගයන් වන ස්නෝවි බල්ලාත් කපිතාන් හැඩොක් ද සමගින් පළමු වරට කළ එළි බැස්සේ 1929 දී ය. ඔහුටම ආවේනික කෙස් විලාසිතාවකින් හා අමුතුම ආකාරයේ කෙටි දිග කලිසමකින් සැරසී රසිකයන් හමුවට ආ ටින් ටින් ඉතා ඉක්මණින්ම ඔවුනගේ සිත දිනා ගත්තේ ය.

ජෝර්ජස් රේමි (Georges Remi) සිය කාටූන් ඇන්දේ Herge යන ආරූඪ නමින් ය. සිය නියම සම්පූර්ණ නමේ මුලකුරු අකුරු ආපස්සට ලියා ප්‍රංශ භාෂාවෙන් උච්චාරණය කළ විට Herge නම සෑදෙයි.

ටින් ටින් කතා පොත් වලට අනුව ඔහු පුවත් පත් වාර්තාකරුවෙකි. එනමුදු ටින් ටින් ගැන කතා කරන බොහෝ අයට ඔහු අද්භූත චරිතයකි. එයට හේතු කාරණා බොහෝ ය. පුවත්පත් වාර්තාකරුවකු යයි කීවාට ඔහු කිසිදිනෙක පුවත්පතකට ලිපියක් ලියනු දැකිය නොහැකි ය. ඒ මදිවාට ඔහු ඕපපාතිකයකු සේ ය. ඔහුගේ දෙමාපියන් ගැන කිසි විටෙක සඳහනක් මේ කතා මාලාවේ කොතැනකවත් නැත.

ටින් ටින් කතා මාලාවේ අනෙක් විශේෂත්වය නම් ගැහැණු චරිත අඩු වීම ය. මේ කතා තුළ දී අපට හමු වන 350 ක් පමණ වන පිරිමි චරිත සමගින් ගැහැණු චරිත හමු වන්නේ 8 ක් පමණකි.

භාෂා 60 කට පමණ පෙරළුණ ටින් ටින් කතා පොත් වසරකට මිලියන දෙකකට වැඩියෙන් අදත් විකිණෙන්නේ අසූ වියැති තරුණ ටින් ටින් ට ඇති ආකර්ශණය කොපමණ දැයි පෙන්වා දෙමින් ය.

- ජගත්







ලෝ පතල කාටූන් වීරයා - ටින් ටින් - අසූ වැනි වියට පා තැබුවේ ය.

PRINT 1000 (360gsm)
business cards
just from $99
send email - info@saamart.com.au
Visit
saamArt.com.au
call now - 0433 638 610